# කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

## යහපත් නිපැයුම් පරිචයන් (GMP) පිළිබඳ සහතිකකරණය සඳහා රජයෙන් සහන

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය විසින් දේශීය කර්මාන්තවල ඵලදායිතාවය ඉහළ නැංවීම හා ආහාර සුරක්ෂිතතාවය වර්ධනය කිරීම සඳහා විශේෂ අනුග්‍රහයක් ලබාදීමේ වැඩසටහනක් ආරම්භ කර ඇත. මේ සඳහා 2025 ජනවාරි 01 දිනට වාර්ෂික පිරිවැටුම රු. මිලියන 350 ට අඩු සහ සේවක සංඛ්‍යාව 50 ට අඩු පහත සඳහන් සුළු කර්මාන්ත ක්ෂේත්‍රයන් සඳහා (GMP) තත්ත්ව සහතික ලබා ගැනීමට අයදුම් කළ හැකිය.

| | | |
|---|---|---|
| ● සැකසූ ආහාර නිෂ්පාදන | ● අගය එකතු කළ තේ ආශ්‍රිත නිෂ්පාදන | ● කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන |
| ● අගය එකතු කළ කුළුබඩු නිෂ්පාදන | ● අගය එකතු කළ පොල්, කොහු හා කොහු ආශ්‍රිත නිෂ්පාදන | ● ඇසුරුම් නිෂ්පාදන |
| ● බටහිර හා දේශීය ඖෂධ හා ආශ්‍රිත නිෂ්පාදන | ● රූපලාවණ්‍ය ආලේපන හා ආශ්‍රිත නිෂ්පාදන | ● තීන්ත, රසායනික ද්‍රව්‍ය, මුද්‍රණ ද්‍රව්‍ය හා ආශ්‍රිත නිෂ්පාදන |

**ප්‍රතිලාභ :**

- තෝරාගත් කර්මාන්ත සඳහා උපරිමය රු. 100,000/- දක්වා සහතිකපත් ගාස්තු ගෙවීම් කරන අතර, සහතිකපත් සහ අදාළ බිල්පත් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ගාස්තු ප්‍රතිපූර්ණය කරනු ලැබේ.
- වැඩසටහන ක්‍රියාත්මක කරන කාලය තුළ අවශ්‍ය මගපෙන්වීම සිදු කරනු ලැබේ.

**යෝග්‍යතාවය :**

- අවම වශයෙන් අවු. 01 ක නිෂ්පාදන වාර්තා ඉදිරිපත් කළ යුතුය.
- ඉල්ලුම්පත් ඉදිරිපත් කරන අවස්ථාවේදී කර්මාන්තය සාර්ථකව ක්‍රියාත්මක විය යුතුය.
- අයදුම්පත් යොමුකරන අවස්ථාව වන විට අදාළ සහතික ලබාගැනීම සඳහා සහතිකකරණ ආයතන වෙත අයදුම් නොකළ කර්මාන්තයක් විය යුතුය.

**තෝරා ගැනීමේ ක්‍රියාවලිය :**

- පුවත්පත් දැන්වීමේ සඳහන්ව ඇති කොන්දේසි මත සහ සම්මුඛ පරීක්ෂණයේදී තහවුරු කර ගන්නා කරුණු මත ඉහත ක්ෂේත්‍රයන්ට අදාළ නිෂ්පාදන කර්මාන්ත 50 ක් තෝරා ගැනීම සිදු කෙරේ.

**අනෙක්තු කොන්දේසි :**

- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් (SLSI) හෝ ශ්‍රී ලංකා ප්‍රතීතකරණ මණ්ඩලයේ (SLAB) ප්‍රතීතකරණය ලද සහතිකකරණ ආයතනයකින් සහතිකපත් ලබා ගත යුතුය.
- සහතිකපත් සහ බිල්පත් 2025 නොවැම්බර් 07 එදිනට හෝ දිනට පෙර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර අදාළ සහතිකපත් ගාස්තු ප්‍රතිපූර්ණය කරගත යුතුය.
- අදාළ කර්මාන්තය සහතිකකරණ ක්‍රියාවලිය සිදුවන කාලය තුළ වෙනත් රජයේ ආයතනයකින් මෙයට සමාන ප්‍රතිලාභ ලබා නොගත යුතුය.
- තෝරා ගන්නා අයදුම්කරුවන් නියමිත දිනට ප්‍රථම තම ආයතනයේ සහතිකකරණ ක්‍රියාවලිය අවසන් කරන බවට අමාත්‍යාංශය සමග එකගතා ගිවිසුමකට යටත් විය යුතුය.

**අයදුම් කිරීම :**

- පහත සඳහන් QR කේතය මගින් හෝ ගූගල් දිගුව මගින් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2025 ජූනි 06 දින හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතුය.

**ලිපිනය :**

අධ්‍යක්ෂ, සංවර්ධන අංශ 1, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය,
73/1, ගාලු පාර, කොළඹ 03.

**වැඩි විස්තර :** දුරකථන අංක : 0112422319 ඇමතීමෙන් හෝ
**Email : foodsymp2024@gmail.com /**
**developmentdivisiongmp@gmail.com** මගින් හෝ
**Website : www.industry.gov.lk** මගින් ලබාගත හැක.

**ලේකම්,**
**කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය,**
**73/1, ගාලු පාර, කොළඹ 03.**

Google Link : https://rb.gv/gr5pmo